# කාසි හා නෝට්ටු සංසරණයට ලක් නොවී සැඟව පැවතීමේ ආර්ථික ප්‍රතිවිපාක

ඩී. කේ. චම්පිකා[1]
ඒ. ජී. දිනුක[2]

**හැඳින්වීම:**

ඓතිහාසික ශ්‍රී ලංකාවේ කාසි භාවිතය පිළිබඳව සඳහන් වන පළමු සෙල් ලිපිය වන්නේ ක්‍රි.පූ. 3 වන සියවසෙහි අනුරාධපුර යුගයට අයත් කෑගල්ල මාම්පිට විහාරයේ පිහිටි සෙල් ලිපිය වේ. එයට අනුව එකල ශ්‍රී ලංකාවේ 'කහාපන' නම් මුදල් වර්ගය භාවිතා කර ඇත. එම තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වී වර්තමානයේ භාවිත වන කාසි හා නෝට්ටු භාවිතයට යොමු විය. මුදල් නිකුත් කිරීමේ පූර්ණ බලය රටක රජයට හිමි වන අතර මුදල් නීති පනතට අනුව රජය වෙනුවෙන් මුදල් නිකුත් කිරීමේ බලය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇත. මහ බැංකුව ප්‍රකාශ කරන පරිදි මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකය තුළ කාසි සංසරණයට මුදාහැර ඇති ප්‍රමාණය කෝටි 555ක් වේ. මීට අමතරව කාසි භාවිතයත් සමඟ 1951 දී ශ්‍රී ලංකාව තුළ නෝට්ටු ද මුද්‍රණය කළ අතර මේ වන විට අවස්ථා 11 ක් තුළ විවිධ වර්ගයේ නෝට්ටු ද ආර්ථිකයේ සංසරණය වීමට මුදා හැර ඇත.

ඒ කෙසේ වුවද වර්තමානය වන විට ශ්‍රී ලංකා ආර්ථිකය දෙස අවධානය යොමු කිරීමේ දී සංසරණය වෙමින් පවතින කාසි සහ වටිනාකමින් අඩු මුදල්වල (රු 10,20) දැඩි හිඟතාවයක් පවතිනු ලබන බව මහ බැංකුව නිවේදනය කර ඇත. ඒ තුළින් බොහෝ ආර්ථික ගැටලු ප්‍රමාණයක් ද ආර්ථිකයේ නිර්මාණය වෙමින් පවතින බවද ඒ යටතේ තව දුරටත් විග්‍රහ කෙරිණ.

**පර්යේෂණ ගැටලු**

ඒ අනුව මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වන්නේ කාසි හා නෝට්ටු සංසරණයට ලක් නොවී සැඟව පවත්නා ආකාර මොනවාද? එයට බලපෑ හේතු මොනවාද? එමගින් ඇතිවිය හැකි ආර්ථික ප්‍රතිවිපාක මොනවාද යන්න අධ්‍යයනය කිරීම වේ.

**පර්යේෂණයේ අරමුණු හා වැදගත්කම**

ඒ අයුරින් කාසි හා නෝට්ටු සංසරණයට ලක් නොකර සැඟව පවතින ස්ථාන හඳුනා ගැනීමත්, එයට බලපෑ හේතු මොනවාද යන්න හඳුනා ගැනීම සහ එමගින් ඇතිවිය හැකි ආර්ථික ප්‍රතිවිපාක හඳුනා ගැනීමත් පර්යේෂණයේ අරමුණු වූ

---

1 හිටපු නිබන්ධන උපදේශිකා, ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය, විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, champikadolamulla@gmail.com,
2 කළමණාකරණ සහකාර, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව, ගාල්ල

අතර එම තත්ත්වය මනාව හඳුනාගෙන එයට නිසි විසඳුම් ලබාදීම සහ ඒ පිළිබඳ ජනතාව දැනුවත් කිරීම පර්යේෂණයේ වැදගත්කම වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ඒ අනුව පර්යේෂණ අරමුණ තෘප්ත කර ගැනීම සඳහා මිශ්‍ර ක්‍රමවේදය භාවිත කළ අතර එහිදි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන තොරතුරු හා දත්ත ද්විත්වයම භාවිතට ගැණින. ඒ සඳහා තොරතුරු හා දත්ත ද්විතීයික මූලාශ්‍ර වන පොත්පත්, පුවත්පත්, සඟරා සහ අන්තර්ජාලය මගින් ලබා ගැනීම ප්‍රමාණවත් වූ බැවින් ප්‍රාථමික මූලාශ්‍ර භාවිතයෙන් තොරතුරු හා දත්ත එක් රැස් කිරීම ප්‍රධාන ලෙස සිදු නොකරන ලදි. රැස්කර ගනුලැබූ තොරතුරු හා දත්ත විස්තරාත්මක විශ්ලේෂණය යටතේ විශ්ලේෂණය කරමින් නිගමනවලට එළඹෙන ලදි.

**පර්යේෂණයේ ප්‍රතිඵල**

පර්යේෂණයෙන් ලැබූ ප්‍රතිඵල මත ආර්ථිකයේ කාසි හා නෝට්ටු සංසරණයට ලක්වීමකින් තොරව එක්රැස්ව පවත්නා ස්ථාන කිහිපයක් හඳුනාගනු ලැබිණ. ඒ අතරින් ආගමික ස්ථානයන්හි පිං පෙට්ටි හා මුදල් පිං පිණිස පූජා කිරීමට ඇති ස්ථාන, මහජනතාව සතු කැට, ආභරණ ලෙස, භාරහාර සඳහා කාසි හා නෝට්ටු වලින් ආභරණ සහ සැරසිලි සාදා පූජා කිරීම, නිවෙස්වලට වාසනාව ගෙන දෙන බවට විශ්වාස කරමින් මුට්ටි වල කාසි පුරවා තැබීම යනාදි ස්ථානයන්හි මෙම කාසි හා නෝට්ටු සංසරණයට ලක් වීමකින් තොරව හෝ සංසරණය අවම කරමින් විශාල මුදල් ප්‍රමාණයක් ඒකරාශි කර තැබීම ප්‍රයෝගිකවම හඳුනාගත හැකි විය. මෙහිදී ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රකාශ කරන ආකාරයට විහාරස්ථානවල පිං පෙට්ටි තුළ ඒකරාශී වන මුදල් ඇතැම් විහාරස්ථාන මගින් බැංකු වෙත ලබාදෙනු ලබන බව හඳුනාගත හැකි විය. නිදසුනක් ලෙස වාර්ෂිකව ශ්‍රී පාදස්ථානයට ඒකරාශීවන ලක්ෂ සංඛ්‍යාත පඬුරු ගෝනිවල බහා රත්නපුර මහජන බැංකුවේ ශ්‍රී පාදස්ථානය නමින් ඇති ගිණුමේ තැන්පත් කරන බව හඳුනාගත හැකි විය. නිතිපතා විශාල මුදලක් ඒකරාශී වන දිවයිනේ සුප්‍රසිද්ධ ආගමික ස්ථානයන්හි මෙම කරතව්‍යය ක්‍රමානුකූලව සිදුකෙරෙන නමුත් ඇතැම් කුඩා හා මධ්‍යම ආගමික ස්ථානවල පිං පෙට්ටි තුළ ඇති මුදල් දිගු කාලයක් තිස්සේ සංසරණයකින් තොරව දිවයිනේ විවිධ ස්ථානවල පවතිනු ලබන බව අධ්‍යයනය මගින් හඳුනාගත හැකි විය.

එමෙන්ම, ශ්‍රී ලාංකික බැතිමතුන් දඹදිව වන්දනාවේ නිරත වන විට විශාල වශයෙන් පඬුරු කාසි රැගෙන යන අතර බොහෝ අසල්වාසීන් ද ඒ සඳහා විශාල පඬුරු ප්‍රමාණයක් ලබා දේ. ඔවුන් එම මුදල් දඹදිව විහාරස්ථාන සඳහා පූජා කිරීම අගය කළ යුත්තක් වන නමුදු ආර්ථිකමය වශයෙන් එය ශ්‍රී ලංකාවේ මුදල් සංසරණයට පවතින කාසි හා නෝට්ටු සීමා කිරීමකි. මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විශ්වාස කරන පරිදි ටොන් 10-20ක පමණ මුදල් ප්‍රමාණයක් බුද්ධ ගයාවේ මහා බෝධි විහාරයෙහි ගබඩාවක තැන්පත් කර ඇත. ඉන්දීය ආර්ථිකය තුළ මෙම මුදල් භාවිත කරනු නොලැබේ. මුදල් ශ්‍රී ලංකාවට භාර දීමට ද තවමත් ඉන්දීය

රජය අවසර ලබා දී නැත. ලබා දුන්න ද එය රැගෙන ඒමටද විශාල පිරිවැයක් ද දැරිය යුතුය.

මෙකී හේතු සාදක මත ශ්‍රී ලංකාවේ සංසරණය වන කාසි හා නෝට්ටු හිඟයක් මෑත කාලීනව හටගෙන ඇත. ඒ තුළින් විශාල ආර්ථික ගැටලු ප්‍රමාණයක් මේ වන විට ශ්‍රී ලංකා ආර්ථිකයේ හටගෙන ඇත. ඒ සඳහා කාසි හා අළුතින් නිෂ්පාදනය කිරීමට විශාල පිරිවැයක් ආර්ථිකය දැරිය යුතුය. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ භාවිත වන කාසි විදේශ රටවල නිෂ්පාදනය කර ආනයනය කරන බැවින් ඒ සඳහා අති විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැයවේ. ආර්ථිකයේ සංසරණය වන මුදල් ප්‍රමාණය හා වටිනාකම නිශ්චිතවම හඳුනාගත නොහැකි වීම මත මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ගැටලු වේ. එමෙන්ම, නිෂ්පාදකයන් හෝ පාරිභෝගිකයන් වන ජනතාව හට යම් භාණ්ඩයක්, සේවාවක් මිලදී ගැනීමේදී හෝ අලෙවි කිරීමේදී මාරු කාසි, කුඩා නෝට්ටු හිඟ වීම මත ඉතිරි මුදල් නොලැබීම හේතුවෙන් වියදම වැඩි වීම, නොයෙක් ආර්ථික අලාභ ලැබීම සහ දෝෂාරෝපණය වැනි දෑ මත සමාජ අපහසුතා මෙන්ම සමාජ ගැටලු ඇති වීම සිදු වී ඇත.

මෙකී ගැටලුවලට විසඳුම් ලබා දීම සඳහා ආර්ථිකයේ සංසරණයකින් තොරව සැඟව පවත්නා කාසි හා නෝට්ටු නැවත ආර්ථිකයට මුදා හැරිය යුතු වේ. එහිදී විහාරස්ථානවල සහ මහජනතාවගේ කැටවල නිතිපතා එකතු වන මුදල් කුඩා ප්‍රමාණයක් වුවද කෙටි කාලයක් තුළ බැංකු වෙත හෝ වෙළෙඳසැල් වෙත ලබා දී එම වටිනාකමට සරිලන වටිනාකම වැඩි එක් මුදල් නෝට්ටුවක් ලබා ගැනීම කළ යුතුය. එමෙන්ම තඹ කාසිවලින් ආභරණ සෑදීම තහනම් කළයුතු අතර භාරහාර ලෙස දෙවිවරුන්ට පූජා කරනු ලබන කාසි හා නෝට්ටුවලින් නිර්මාණය කරන ලද ආභරණ වල මුදල් වතාවත් කිරීමෙන් පසු නැවත ආර්ථිකයට මුදා හැරිය යුතුය. එමෙන් ම වාසනාව කැන්දන බවට නිවෙස් වල කාසි මුට්ටි තැන්පත් කිරීම වැනි දෑ අවම කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කළ යුතුය. වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාත්මක කරනු ලබන සැඟවුණු කාසි ආර්ථිකයට මුදා හැරීමේ වැඩසටහන මත කාසි 1000කට රු 200ක අමතර වටිනාකමක් ලබා දීම වැනි වැඩසටහන් දිරි ගැන්වීම මෙන්ම ජනතාව මේ පිළිබඳ දැනුවත් කිරීම සහ ආකල්ප පෝෂණය නිරීම කළ යුතුය.

එකී විසඳුම් මගින් ආර්ථිකයේ සැඟව පවත්නා කාසි හා නෝට්ටු නැවතත් ආර්ථිකයට එක් වීම සිදුවන අතර එමගින් සැළකිය යුතු ආර්ථික පිරිවැයක් අවම වනවා සේම ජනතාවට ද ගණුදෙණු කිරීම වඩාත් පහසු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ආරච්චි, හිදැල්ල. සී. සී. (2001). *මුදල් හා බැංකු.* කොළඹ: සදීපා ප්‍රකාශන මන්දිරය. පිටු 01-24.

සටහන සඟරාව, (2013). ජූලි/අගෝ. පිටු 37-40

ලංකාදීප පුවත්පත, (2013 අගෝස්තු 30)

ලක්බිම, (2013 ජූලි 26)